# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා පර්යේෂණ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා පර්යේෂණ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අචල ජාගොඩගේ මහතා විසින්
2013 නොවැම්බර් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 ඔක්තෝබර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[275 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## ශ්‍රී ලංකා පර්යේෂණ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා පර්යේෂණ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

''පර්යේෂණ හා සංවර්ධන පර්ෂදය'' යන නාමය යටතේ වර්ෂ 2000 දී ආරම්භ කරන ලදුව වර්ෂ 1982 අංක 17 දරන සමාගම් පනතට අනුකූල ව අංක N(A) 1170 යටතේ වෘත්තිකයන්ගේ සංවිධානයක් ලෙස ලියාපදිංචි කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව අංක GA 635 යටතේ ඇපයෙන් සීමිත ලාභ නොලබන වෘත්තිකයන්ගේ සංස්ථාපිත ආයතනයක් ලෙස යළි ලියාපදිංචි කරන ලද්දා වූ මෙම ආයතනය එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායි ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය වඩාත් අවශ්‍යව ඇති හෙයින් ද, පර්යේෂණ හා ඒ ආශ්‍රිත තාක්ෂණික සේවා රට තුළ වඩාත් පුළුල් ලෙස ප්‍රචාරණය කිරීම සඳහා වන මහජන ඉල්ලීම් ඉටු කිරීම සඳහා ආයතනය මහජනයාට වගවන සහ විනිවිද භාවයෙන් කටයුතු කිරීම වඩාත් තහවුරු කිරීම අත්‍යවශ්‍ය බැවින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක හා ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක    දරන ශ්‍රී ලංකා පර්යේෂණ හා සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පර්යේෂණ හා සංවර්ධන ආයතනය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''ශ්‍රී ලංකා පර්යේෂණ හා සංවර්ධන ආයතනය'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය

යුතු ය. තව ද එකී නාමයෙන්, ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3\. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ලාභ ලැබීමේ අරමුණින් තොර පර්යේෂණ ආයතනයක් වශයෙන් පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් පවත්වාගෙන යාම;

(ආ) පර්යේෂණ, සංවර්ධන, අධ්‍යාපනය, පුහුණුව හා ව්‍යාප්තිය යන අංශයන්හි අභිවර්ධනය මගින් පර්යේෂණ සහ සංවර්ධනයේ වැඩි දියුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට සහාය වීම;

(ඇ) පර්යේෂණ, කටයුතුවල අභිචාර්යය අන්තර්ගතයක් ලෙස, උසස් ප්‍රමිතියකින් යුත්, පර්යේෂණ ආචාරධර්ම අනුගමනය කිරීම මෙන්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික පුහුණුව හා ව්‍යාප්තිය;

(ඈ) ආයතනයේ අරමුණු ශ්‍රී ලංකාව තුළ මෙන්ම විදේශයන්හිද ව්‍යාප්ත කිරීම පිණිස සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සාමූහික අධ්‍යයන, ප්‍රසිද්ධ දේශණ, ප්‍රදර්ශන හා පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රහය දැක්වීම, පැවැත්වීම සහ සංවිධානය කිරීමත් ප්‍රවෘත්ති පත්‍ර, වාර සංග්‍රහ, සඟරා, පොත්, චිත්‍රපට, වීඩියෝ පටි, කැසට් විද්‍යුත් දත්ත සහ තොරතුරු දත්ත ගබඩා උපක්‍රම නිෂ්පාදනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම;

(ඉ) කෙටි පාඨමාලා, සහතික පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම සහ සංස්ථාවේ රීතිවල දක්වා ඇති අවශ්‍යතා සාර්ථකව සම්පූර්ණ කරන තැනැත්තන්ට සහතික හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම;

(ඊ) දේශීය සහ ජාත්‍යන්තර අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, විශිෂ්ඨතා සහතික, අභිදාන, ප්‍රදාන, ශිෂ්‍යාධාර, ශිෂ්‍යභාවය ඇතුළු සම්මාන ප්‍රදාන ලබාදීම සහ ආයතනයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම පිණිස පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම;

(ඌ) පර්යේෂණ සංවර්ධනය අධ්‍යාපනය, පුහුණුව සහ ව්‍යාප්තිය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධනයට අදාළ වැඩවල නියැලී සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ ජාතික හා ජාත්‍යන්තර ආයතන සමග සහයෝගයෙන් වැඩ කිරීම;

(ඍ) ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීමය අභිරුචිය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඐ) ආයතනයේ ම කොටසක් වශයෙන් මේ දක්වා පවත්වා ගනු ලැබූ ශ්‍රී ලංකා නිවුන් ලේඛනාගාරයේ පාලනය හා ප්‍රවර්ධනය, මෙන්ම එම දත්ත ගබඩා හා රසායනාගාරය හා පර්යේෂණාගාරයේ ද පූර්ණ පරිපාලනය හා අයිතිය ද,

(2) මේ වගන්තියේ (1) උප වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය පිළිබඳ වෙනස්කම්වලින් තොරව ඒවා ක්‍රියාත්මක කිරීමට ආයතනය සහතික විය යුතු ය.

ආයතනයේ කටයුතු කළමනාකරණ කිරීම.

4. (1) ආයතනයේ කටයුතු වාර්ෂික මහා සභා රැස්වීමක දී වර්ෂ තුනක කාලයක් සඳහා තෝරා පත් කරනු ලබන උපරිම වශයෙන් හත් දෙනකුගෙන් යුත් සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වූ පාලක මණ්ඩලයක් විසින්, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ ආයතනයේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය. කෙසේ වුව ද, පළමුවන පාලක මණ්ඩලය වර්ෂ තුනක කාලයක් හෝ ඔවුන් විසින් ලිඛිතව ඉල්ලා අස්වීම භාර දෙන තෙක් හෝ ආයතනයේ ධුර දරන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ පාලක මණ්ඩලයේ ධුර දරමින් සිටි මෙම පනතේ උපලේඛනයේ නම් සඳහන් සාමාජිකයන්ගෙන් ආයතනයේ පළමුවන භාරකාර මණ්ඩලය සමන්විත විය යුතු ය.

ආයතනයේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ වෙනත් යම් ලිඛිත නීතියකට සහ විධිවිධානවලට යටත්ව, ආයතනයේ පරමාර්ථ හෝ ඉන් එක් පරමාර්ථයක් වැඩිදියුණු කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ

අපේක්ෂිත සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීම, ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළු පහත දැක්වෙන දෑ කිරීමේ බලය ආයතනයට ඇත්තේ ය :—

(අ) ශ්‍රී ලංකා තිවුන් ලේඛනාගාරයේ පූර්ණ අයිතිය හා පරිපාලනය මෙන් ම ජාන පර්යේෂණාගාරයේ අයිතිය හා පාලනය කිරීමේ බලය ඇත්තේ ය;

(ආ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ නිශ්චල දේපලක් අත්කර ගැනීමට, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ඇ) ආයතනයේ කාර්යයන් සඳහා අවශ්‍යවන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට හෝ ඉදිකිරීමට;

(ඈ) ආයතනයේ කාර්යය සඳහා රජයේ හෝ අනුමත බැංකු හා ආයතනවලින් මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට, ආධාර සහ පරිත්‍යාග (දේශීය හෝ විදේශීය) වශයෙන් ලබා ගැනීමට;

(ඉ) ආයතනයේ කටයුතු සඳහා, පාලක මණ්ඩලයේ සාමාජිකයන් සුදුසු යැයි සළකනු ලබන ඕනෑම බැංකුවක අරමුදල් ආයෝජනය කිරීම, ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යෑම;

(ඊ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග රැස්කිරීම සහ භාර ගැනීමට;

(උ) ආයතනයේ පරමාර්ථ සඳහා යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඌ) වෙනත් ආයතනයකින් හෝ පුද්ගලයකු / පුද්ගලයින් විසින් බලය පවරන ලද හෝ ලබා දෙන ලද පර්යේෂණ ව්‍යාපෘති සංවිධානය කිරීම හෝ ඉටු කිරීම;

(එ) ආයතනයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පවත්වා ගෙන යෑම සහ සේවයෙන් පහ කිරීමට;

(ඒ) ආයතනයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට; සහ

(ඔ) ආයතනයේ පරමාර්ථ නිසි ලෙස ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූලව වෙනත් සියලු දේ කිරීමට ආයතනයට බලය ඇත්තේ ය.

ආයතනයේ නීති.

**6.** (1) ආයතනය විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) පාලක මණ්ඩලය, සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් සහ ඔවුන්ගේ බලතල ඉවත් කිරීම, ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අනු කමිටු පත් කිරීම, එම අනු කමිටු සඳහා සාමාජිකයන් නොවන අයගේ සේවය ලබා ගැනීම සහ පාලක මණ්ඩලයේ කාර්ය සහ චර්යාව;

(ඇ) ආයතනයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ චර්යාව;

(ඈ) ආයතනයේ, එහි පාලක මණ්ඩලයේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය,

එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම;

(ඉ) පාලක සභාවේ සහ ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) ආයතනයේ දේපල පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති ආයතනයේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති මේ වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) ආයතනයේ සාමාජිකයින් සැම කල්හිම ආයතනයේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට ඉහතින් ම වූ දිනයේ දී ආයතනයේ පැවති සියලු ම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා ආයතනය ට ගෙවිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**8.** ආයතනයේ කිසිදු සාමාජිකයකු ආයතනයේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ සාමාජිකයාගෙන් ආයතනයට අය විය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවා යන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

ආයතනය විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් ආයතනයට හැකියාව සහ බලය

ඇති අතර, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා ආයතනයේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට යටත්ව, ආයතනය විසින් දැරිය යුතු ය.

**ආයතනයේ අරමුදල.**

**10.** (1) ආයතනයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණයන්, පරිත්‍යාග දායක මුදල්, ග්‍රාහක මුදල්, ගාස්තු හෝ ප්‍රදානයන් වශයෙන් ආයතනය වෙනුවෙන් මේ දක්වා ලැබී ඇති, මින් මතු ලැබෙන සියලු මුදල් ආයතනය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරන ලද ඕනෑම වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් එකී අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උද්ගත වුව ද මෙහි දක්වා ඇති පරිදි හුදෙක් ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා අදාළ කරගනු ලැබිය යුතු ය.

**ගිණුම් සහ විගණනය.**

**11.** (1) ආයතනය ට ලැබුණු සහ ආයතනය විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට ආයතනය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) ආයතනයේ ගිණුම්, සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.**

**12.** ආයතනය විසුරුවා හැරීමේ දී එහි ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල ආයතනයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය

රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම පාලක මණ්ඩලයේ අභිමතය පරිදි කරනු ලැබිය යුතු ය.

ආයතනයේ මුද්‍රාව.

13. ආයතනයේ මුද්‍රාව පාලක මණ්ඩලය භාරයේ තිබිය යුතු අතර, එය ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු ය. තව ද, එකී තැනැත්තන් විසින් ඔවුන් සිට බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් සහතික කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.